# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ඔක්තෝබර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 ඔක්තෝබර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2008 ඔක්තෝබර් මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 74/2006.

චීන සම්භවයක් ඇති තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කරනු නොලැබූ චීන සම්භවයක් ඇති තැනැත්තන් 1948 නොවැම්බර් මාසයේ සිට ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින බැවින් ද, පුරවැසිභාවයක් නොමැතිකම නිසා ඔවුනට බොහෝ දුෂ්කරතාවලට මුහුණදීමට සිදු වී ඇති හෙයින් ද : පූර්විකාව.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික වී ඇති පුරවැසි අයිතිවාසිකම් භුක්ති විඳීමට ඔවුනට හැකිවීම පිණිස චීන සම්භවයක් ඇති එම තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව පියවර ගැනීමට අදහස් කර ඇති බැවින් ද :

චීන සම්භවයක් ඇති තැනැත්තන්ගේ පුරවැසිභාවය පිළිබඳ ප්‍රශ්නය හැකිතාක් ඉක්මනින් විසඳීම ජාතික යහපත උදෙසා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (අ) 1948 නොවැම්බර් මස 15 වන දින සිට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවකු වශයෙන් සිට ඇති; හෝ

(ආ) 1948 නොවැම්බර් මස 15 වන දින සිට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවකු වශයෙන් සිටි තැනැත්තකුගෙන් පැවත එන්නා වූ ද, දැනට ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින්නා වූ ද,

චීන සම්භවයක් ඇති යම් තැනැත්තකුට "ශ්‍රී ලංකාවේ පුරවැසියකු" යන තත්ත්වය ප්‍රදානය කරනු ලැබීම සඳහා, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව ඉල්ලුම් කිරීමට හිමිකම ඇත්තේ ය. ඇතැම් තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කරනු ලැබීම සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් ලැබීම.

2—PL 003033—3.500 (2008/06)

ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ලබා ගැනීමෙන් ඇතිවන බලපෑම.

3. ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ලැබීමට හිමිකම් ඇති සෑම තැනැත්තකුටම ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ලැබීමෙන් පසු—

(අ) නීතිය මගින් පිළිගනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසියකු, සතු සියලු අයිතිවාසිකම්වලට සහ වරප්‍රසාදවලට හිමිකම ඇත්තේ ය;

(ආ) ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකුට අදාළ වන ආකාරයට සහ එසේ අදාළ වන ප්‍රමාණයට පුරවැසිභාවය අහිමි කිරීමට, නැතිවීමට සහ අත්හැරීමට අදාළ තත් කාලයේ බලපවත්නා නීතියේ විධිවිධානවලට යටත් විය යුතු ය; සහ

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන් පසුව යම් තැනැත්තකුගේ හෝ අවස්ථාවෝචිත පරිදි එම තැනැත්තාගේ දෙමාපියන්ගේ, මුතුන්මිත්තන්ගේ හෝ ස්වාමිපුරුෂයාගේ ආරම්භක රටෙහි බලපවත්නා යම් නීතියක් යටතේ එම තැනැත්තාට හිමිකම් තිබූ හෝ හිමිකම් ලැබිය හැකිව තිබූ සිවිල් සහ දේශපාලන තත්ත්වය පිළිබඳ සියලු අයිතිවාසිකම් මේ පනත ප්‍රකාශයට පත් කිරීමෙන් පසු අත්හරිනු ලැබ ඇති ලෙස සළකනු ලැබිය යුතු ය;

(ඈ) සිවිල් තත්ත්වයට, පෞද්ගලික අයිතිවාසිකම්වලට, වගකීම්වලට සහ දේපළ දැරීමට අදාළ හෝ සම්බන්ධ සියලු කාරණාවල දී ශ්‍රී ලංකාවේ අදාළ නීතිවලට යටත් විය යුතු ය.

පුරවැසිභාවය පිළිබඳ සහතිකය සඳහා වූ ඉල්ලීම.

4. (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කරනු ලැබීම සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම ඇති යම් තැනැත්තෙක් එසේ ඉල්ලුම් කිරීමට කැමති නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් නිකුත් කිරීම සඳහා මේ පනතේ "අ" උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව වූ ඉල්ලීමක් පාලකවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි සෑම ඉල්ලීමක්ම එම උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව වූ දිවුරුම් දීමක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමේ දි 2 වන වගන්තිය ප්‍රකාරව ඉල්ලුම්කරුට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති බවට පාලකවරයා සෑහීමට පත්වන අවස්ථාවක පාලකවරයා විසින් වහාම එම ඉල්ලීම අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් එක් එක් අවස්ථාව පිළිබඳ සිද්ධිමය කරුණු සැලකිල්ලට ගෙන—

(අ) ඉල්ලුම්කරුට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා වූ එම ඉල්ලීම අනුමත කර ඊට ඉඩ දිය යුතු ය; නැතහොත්;

(ආ) ඉල්ලුම්කරුට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීම ජාතික යහපත උදෙසා හේතු නොවන බව අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, (2) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයට ඉඩදීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(4) (2) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීමක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇති අවස්ථාවක, චීන සම්භවයක් ඇති තැනැත්තාට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා පාලකවරයා විසින් මේ පනතේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය විය හැකි පියවර ගනිමින් මේ පනතේ "ආ" උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් එම තැනැත්තාට නිකුත් කිරීමට පියවර ගත යුතු ය.

(5) මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, එම තීරණය අවසාන සහ තීරණාත්මක විය යුතු අතර, කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය. තව ද, එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඉල්ලුම්කරුට දැනුම් දීම පාලකවරයාගේ කාර්යය වන්නේ ය.

ඉල්ලුම්කරුගේ පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ බාල වයස්කාර ළමයකුගේ නම ඇතුළත් කිරීම.

5. (1) ඉල්ලුම්කරුට බාලවයස්කාර ළමයකු හෝ එවැනි ළමයින් සිටින අවස්ථාවක, ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කරනු ලැබීම සඳහා ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේ දී, හෝ තත්කාර්යය සඳහා පසුව ඉදිරිපත් කරනු ලබන ලිපියක් මගින් අවස්ථාවෝචිත පරිදි එම ළමයාට හෝ ළමයින්ට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කරන ලෙස ඉල්ලා සිටිය හැකි අතර, 4 වන වගන්තිය ප්‍රකාරව තමා වෙත නිකුත් කරනු ලබන පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ එම ළමයා හෝ ළමයින් පිළිබඳ විස්තර ද ඇතුළත් කරන ලෙස ද ඉල්ලා සිටිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක එම ළමයාට හෝ ළමයින්ට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය විය හැකි පියවර මේ පනතේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යවරයා විසින් ගනු ලැබිය යුතු අතර, ඉල්ලුම්කරුගේ පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ ළමයා හෝ ළමයින් පිළිබඳ විස්තර ඇතුළත් කරන ලෙස වහාම නියම කරනු ලැබිය යුතු ය.

ප්‍රකාශනය දිවුරුමක් මගින් කළ යුතු බව.

6. (1) මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තකු විසින් ම එම තැනැත්තා වෙත දැනුම් දෙනු ලබන දිනයක දී ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ඔහු විසින් අත්කර ගැනීමට අදාළ "ඇ" උපලේඛනයේ දක්වා ඇති ප්‍රකාශයට සාරානුකූලව වූ ප්‍රකාශයක්, දිවුරුමක් හෝ ප්‍රතිඥාදීමක් මගින් කිරීම හෝ අත්සන් කිරීම කළ යුතු ය. මේ වගන්තිය ප්‍රකාරව එම තැනැත්තා විසින් ප්‍රකාශයක් කිරීමේ දී "ආ" උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් එම තැනැත්තා වෙත නිකුත් කිරීමට පාලකවරයා විසින් කටයුතු සැලැස්විය යුතුය. එම තැනැත්තා විසින් මේ වගන්තිය මගින් නියම කර ඇති පරිදි දිවුරුම හෝ ප්‍රතිඥාව මගින් ප්‍රකාශයක් සිදු කරන හෝ අත්සන් තබන දිනයේ සිට එම තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පුරවැසිභාවය පිළිබඳ සහතිකයෙහි නම ඇතුළත් කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුගේ සෑම බාලවයස්කාර ළමයකුට හෝ ළමයින්ට මේ වගන්තිය මගින් නියම කර ඇති පරිදි දිවුරුම හෝ ප්‍රතිඥාව මගින් ප්‍රකාශයක් සිදු කළ හෝ අත්සන් කළ දින සිට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ලැබිය යුතු අතර, එම ළමයා හෝ ළමයින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස සලකනු ලැබිය යුතු ය.

රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු බව.

7. මේ පනත යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තන්ගේ නම් සහ විස්තර ඇතුළත් රෙජිස්ටරයක් මේ පනතේ "ඇ" උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සාරානුකූලව පවත්වාගෙන යා යුතු ය.

පනත වෙනත් නීති අභිබවා ක්‍රියාත්මක විය යුතු බව.

8. චීන සම්භවයක් ඇති තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීමට අදාළව වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වූවද, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මේ පනත අවුරුදු පහක් බලපැවැත්විය යුතු බව.

9. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට අවුරුදු පහක කාලයක් සඳහා බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

10. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

11. මේ පනතේ කාර්ය සඳහා— අර්ථ නිරූපණය.

"පාලකවරයා" යන්නෙන් (351 වන අධිකාරය වූ) ආගමන හා විගමන පනත යටතේ පත් කරන ලද පාලකවරයා අදහස් වන අතර, මේ පනතේ කාර්ය සඳහා පාලකවරයා විසින් පවරන ලද, වෙන් කර දී ඇති හෝ පනවනු ලබන යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ කිරීමට ලිඛිතව බලය පවරා ඇති නිලධරයන් ද ඊට ඇතුළත් වේ;

"චීන සම්භවයක් ඇති තැනැත්තා" යන්නෙන් 1948 නොවැම්බර් මස 15 දිනට පෙර ශ්‍රී ලංකාවට පැමිණ ශ්‍රී ලංකාවේ නීත්‍යනුකූලව පදිංචිව සිටින චීන ජාතියට අයත් තැනැත්තකු හෝ එවැනි තැනැත්තකුගෙන් පැවත එන්නා වූ ද, ශ්‍රී ලංකාවේ නීත්‍යනුකූලව පදිංචිව සිටින්නා වූ ද, තැනැත්තකු හෝ අදහස් වේ.

"අ" උපලේඛනය

(4 වන වගන්තිය)

2008 අංක 38 දරන වීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීම සඳහා වූ පනත.

පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් සඳහා වූ ඉල්ලීම.

1. ඉහත කී පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා මට හිමිකමක් ඇති බවත්, මා වැඩිහිටි වයසට එළඹ ඇති බවත්, මා දිගටම ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින බවත්............................................පදිංචි..........................................වන මම මෙයින් ප්‍රකාශ කරමි.

2. ඉහත කී පනතේ 4 වන සහ 5 වන වගන්ති ප්‍රකාරව පුරවැසි භාවය පිළිබඳ සහතිකයක් ප්‍රදානය කිරීම සඳහා මම මෙයින් ඉල්ලුම් කරමි.

3. 5 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මා වෙත නිකුත් කරනු ලබන පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ මගේ බාල වයස්කාර ළමයාගේ නම ඇතුළත් කිරීම සඳහා මම තවදුරටත් ඉල්ලුම කරමි. මා පිළිබඳවත් මගේ කලත්‍රයා සහ මගේ බාලවයස්කාර ළමයා/ළමයින් පිළිබඳවත් අදාළ විස්තර පහත දැක්වේ.

ඉල්ලුමකරුගේ විස්තර:

(අ) සම්පූර්ණ නම: ..........................................................................

(ආ) ලිපිනය: ..........................................................................

(ඇ) රැකියාව: ..........................................................................

(ඈ) ස්ත්‍රී/පුරුෂභාවය පිරිමි/ගැහැණු: ..........................................................................

(ඉ) උපන් දිනය/උපන් ස්ථානය: ..........................................................................

(ඊ) ජාතික හැඳුනුම්පත් අංකය (ඇත්නම්): ..........................................................................

(උ) (i) ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිය සිදු වූ දිනය: ..........................................................................

(ii) ශ්‍රී ලංකාවේ පදිංචියට පෙර ස්ථිරව පදිංචිව සිටි රට: ..........................................................................

(ඌ) ඉල්ලුම්කරුගේ දෙමාපියන් පිළිබඳ විස්තර:

| පියා | මව |
|---|---|
| (i) සම්පූර්ණ නම | (i) සම්පූර්ණ නම |
| (ii) උපන් දිනය/ස්ථානය | (ii) උපන් දිනය /ස්ථානය |
| (iii) ශ්‍රී ලංකාවේ ස්ථිරව පදිංචි වූ දිනය | (iii) ශ්‍රී ලංකාවේ ස්ථිරව පදිංචි වූ දිනය |
| (iv) ලිපිනය | (iv) ලිපිනය |
| (v) ශ්‍රී ලංකාවේ පදිංචිවීමට පෙර ස්ථිරව පදිංචිව සිටි රට | (v) ශ්‍රී ලංකාවේ පදිංචිවීමට පෙර ස්ථිරව පදිංචිව සිටි රට |
| (vi) ජාතිය | (vi) ජාතිය |

(එ) ඉල්ලුම්කරු හෝ ඉල්ලුම්කරුගේ මව සහ පියා ශ්‍රී ලංකාවේ උපත ලැබුවේ නම් ශ්‍රී ලංකාවේ ස්ථිරව පදිංචිව සිටි පළමුවන මුතුන් මිත්තා පිළිබඳ විස්තර:—

(i) සම්පූර්ණ නම: ..........

(ii) ශ්‍රී ලංකාවේ ස්ථිරව පදිංචි වූ දිනය: ..........

(iii) ලිපිනය (කලින්/දැනට): ..........

(iv) ඉල්ලුම්කරුට ඇති නෑදෑකම: ..........

කලත්‍රයා පිළිබඳ විස්තර:

(i) කලත්‍රයාගේ සම්පූර්ණ නම: ..........

(ii) උපන් දිනය සහ ස්ථානය: ..........

(iii) ලිපිනය: ..........

(iv) විවාහය සිදු වූ දිනය සහ ස්ථානය: ..........

(v) ජාතිය: ..........

(vi) ජාතික හැඳුනුම්පත් අංකය (ඇත්නම්): ..........

බාලවයස්කාර ළමයා/ළමයින් පිළිබඳ විස්තර:

| | නම | ස්ත්‍රී පුරුෂභාවය ස්ත්‍රී/පුරුෂ | උපන් දිනය | උපන් ස්ථානය |
|---|---|---|---|---|
| (i) | | | | |
| (ii) | | | | |
| (iii) | | | | |
| (iv) | | | | |
| (v) | | | | |

දිවුරුම/ප්‍රතිඥාව

(6 වන වගන්තිය)

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවටත්, 2008 අංක දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනතේ 2 වන සහ 4 වන වගන්ති ප්‍රකාරව වූ කොන්දේසි මා විසින් සපුරා ඇති බවත් ..........පදිංචි..........වන මම දිවුරා ප්‍රකාශ කරමි. අවංකවත්, සත්‍ය ලෙසත්, ගම්භීරතා පූර්වකවත් ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන/මහපට ඇඟිලි සළකුණ

දිනය:—

*..........දින ප්‍රතිඥාව දෙන ලදී/දිවුරුම් දෙන ලදී.

මා ඉදිරිපිට දිය.

සාමදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්ගේ අත්සන.

සාමදාන විනිශ්චයකරු/
දිවුරුම් කොමසාරිස්ගේ
නම සහ ලිපිනය.

..........

දිනය: ..........

*අදාළ නොවන දේ කපා හරින්න.

"ආ" උපලේඛනය

(4(4) වන සහ 6 වන වගන්තිය)

**2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත**

**පුරවැසිභාවය පිළිබඳ සහතිකය**

2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන සහ 5 වන වගන්තිවල විධිවිධාන මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි සඳහන් තැනැත්තා/තැනැත්තන් 4 වන සහ 5 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකු/පුරවැසියන් බවට.................................................. අමාත්‍ය වන මම මෙයින් සහතික කරමි.

දිනය: ....................................... ..................................................................
අමාත්‍ය

දිනය: ....................................... ..................................................................
ආගමන හා විගමන පාලක

(අ) පුරවැසියාට අදාළ විස්තර:

1. නම:..................................................................................................
2. පියාගේ නම:......................................................................................
3. කලත්‍රයාගේ නම:.................................................................................
4. ලිපිනය:..............................................................................................
5. ජාතිකත්වය:.........................................................................................
6. ස්ත්‍රී පුරුෂ භාවය පිරිමි/ගැහැණු:..........................................................
7. උපන් දිනය සහ ස්ථානය:.....................................................................
8. ලියාපදිංචි වූ දිනය:...........................................................................
9. දිවුරුම හෝ ප්‍රතිඥාව දුන් දිනය:...........................................................

(ආ) බාලවයස්කාර ළමයින් (ඇත්නම්) ඔවුන් පිළිබඳ විස්තර:

| අනුක්‍රමික අංකය | ලියාපදිංචි වූ දිනය | නම | නැදෑකම | උපන් දිනය සහ ස්ථානය |
|---|---|---|---|---|
| | | | | |

*අදාළ නොවන දේ කපා හරින්න.

## "ඇ" උපලේඛනය

(6 වන වගන්තිය)

### ප්‍රකාශ ආකෘති පත්‍රය

වෙනත් යම් රාජ්‍යයක් කෙරෙහි මගේ පක්ෂපාතීභාවය සම්පූර්ණයෙන් අත්හරින බවත්, ශ්‍රී ලංකාවේ පුරවැසියකු ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ශ්‍රී ලංකාවේ නීති පිළිගෙන ඊට අනුකූලව ක්‍රියාකරන බවත්, මගෙන් ඉටු විය යුතු යුතුකම් විශ්වාසවන්ත ලෙස ඉටු කරන බවත්.................................පදිංචි .................................වන මම ගම්භීරතා පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙසත්, මෙයින් ප්‍රතිඥා දෙමි. /දිවුරා ප්‍රකාශ කරමි.

..................................................

ප්‍රකාශකරුගේ අත්සන/මහපට ඇඟිලි සළකුණ

දිනය: ........................................

.....................................දින දිවුරා ප්‍රකාශ කරන ලදී/ප්‍රතිඥා දෙන ලදී.

මා ඉදිරිපිට දී ය.

..................................................

සාමදාන විනිශ්චයකාර තැනගේ/දිවුරුම් කොමසාරිස්ගේ අත්සන.

සාමදාන විනිශ්චයකාර තැනගේ/
දිවුරුම් කොමසාරිස්ගේ නම,
ලිපිනය සහ මුද්‍රාව.

දිනය: ....................................

*අනවශ්‍ය දේ කපා හරින්න.

(ඈ) උපලේඛනය

(7 වන වගන්තිය)

2008 අංක 38 දරන වින සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත

පුරවැසිභාවය ප්‍රදානය කරන ලද තැනැත්තන් සම්බන්ධයෙන් පවත්වාගෙන යායුතු රෙජිස්ටරයේ ආකෘතිය

(1) අනුක්‍රමික අංකය:—

(2) පුරවැසිභාවය පිළිබඳ සහතිකය නිකුත් කල දිනය:—

(3) නම:—

(4) ලිපිනය:—

(5) ස්ත්‍රී/පුරුෂභාවය:—

(6) ප්‍රධාන ඉල්ලුම්කරුට ඇති නෑදෑකම:—

(7) උපන් දිනය:—

(8) උපන් ස්ථානය:—

(9) දිවුරුම්/ප්‍රතිඥාව ලබාදුන් දිනය:—

(10) සහතිකයේ අංකය:—

(11) සහතිකය අත්සන් කරන නිලධරයාගේ නම:—

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.